# නිපුණතා පාදක ඉගෙනුම

ආචාර්ය පුංචි නිලමේ මීගස්වත්තේ

කැලණිය සරසවියට අඩ සිය වසක් සපිරෙන මේ මොහොතේ ගත වූ යුගය දෙස ආපසු හැරී බලන අතර ම ඉදිරි අඩ සියවස තුළ එහි ගමන් මඟ කුමක් විය යුතු දැයි සලකා බැලීම ආදි විද්‍යාර්ථීන් වන අපගේ ප්‍රධාන වගකීමකි.

සරසවිය දරුවන්ට ය. එය ඔවුන්ගේ අනාගත ජීවිතය ශක්තිමත් කරන්නට ය. ඔවුන් යහපත් පුරවැසියන් කරන්නට ය. ඒ සඳහා අවශ්‍ය පරිසරයන් සරසවිය තුළ නිර්මාණය කිරීම අප විසින් සිදු කළ යුත්තකි. විවිධ හේතු නිසා අද සරසවි තුළ දරුවන් ඇණ කොටා ගන්නේ නම්, ඒ දුර්වලතාව මඟ හරවා ලීමට අප වහා පිළියම් සෙවිය යුතුය. එය පමා කිරීම ජාතික හානියකි. මෙහිදී සරසවි ඇදුරන් සතු විශේෂ කාර්ය භාරයක් පවතී.

සිසුන් ඇණ කොටා ගන්නේ ඇයි ? එය ඔවුන්ගේ චින්තනයේ ප්‍රශ්නයකි. ඔවුහු ක්‍රෝධයෙන්, ඊර්ෂ්‍යාවෙන්, වෛරයෙන් පෙළෙති. තමන්ගේ කාර්යයන් ගැන මනා වැටහීමක් නොමැතිව, අනාගත දර්ශනයක් නොමැතිව, හික්මීමක්, සංවරයක් නොමැතිව අතරමංව සිටින මේ දරුවන් බේරා ගැනීමට, කැලණි සරසවියෙන් ජීවිත ආලෝකමත් කර ගත් අප හැම එක්ව කටයුතු කළ යුතුය.

මේ ප්‍රශ්නය ශ්‍රී ලංකාවේ දේශපාලන ව්‍යුහයේ කොටසක් ලෙස සලකා එයට ජාතික මට්ටමේ විසඳුමක් මිස සරසවි මට්ටමේ විසඳුමක් දිය නොහැකි යැයි කිසිවකු කිව හැකිය. එහෙත් සරසවි මට්ටමින් කළ හැකි කොටසක් තිබේ.